# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2301/39 - 2022 ඔක්තෝබර් මස 12 වැනි බදාදා - 2022.10.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

අවසර නොලබා මාස තුනක කාල සීමාවක් සභා රැස්වීම් වලට සහභාගි නොවීම හේතුකොට ගෙන වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ, අංක 17 - උරුම්පිරායි දකුණ කොට්ඨාසයට තේරී පත්වූ සුබ්‍රමණියම් සිවබාලන් අයත් වන්නා වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාලපරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ, අංක 17 - උරුම්පිරායි දකුණ කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා කුමාරසාමි කුණෙස්වරන් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී රාජේන්ද්‍රම් ක්‍රිස්ට් අමල්රාජ් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, කුමාරසාමි කුණෙස්වරන්, වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ, අංක 17 - උරුම්පිරායි දකුණ කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් ප්‍රකාශ කරමි.

ආර්. සී. අමල්රාජ්,  
තේරීම්භාර නිලධාරී,  
වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 11 වැනි දින,  
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,  
යාපනය.

EOG 10 - 0101


1A - G 37761 — 16 (2022/10)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*